# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1787/22 - 2012 දෙසැම්බර් මස 05 වැනි බදාදා - 2012.12.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

විධාන අංක - 42

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත

10(1)(අ) වැනි වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10(1)(අ) වගන්තිය මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව කටයුතු කරමින් සියලුම ඖෂධ හා විටමින් වර්ග නිෂ්පාදනය කරන්නන් හා ආනයනකරුවන් විසින් පහත සඳහන් තොරතුරු එකී ඖෂධ හා විටමින් වර්ගවල ඇසුරුම හෝ බහාලුම හෝ ඒකකය මත පැහැදිලිව, මැකිය නොහැකි තීන්ත වර්ගයකින් සඳහන් කළ යුතු බවට මෙයින් විධාන කරනු ලැබේ.

(අ) උපරිම සිල්ලර මිල සලකුණු කිරීම ;
(ආ) කාණ්ඩ අංකය විශේෂිතව දැක්වීම ;
(ඇ) නිෂ්පාදිත දිනය විශේෂිතව දැක්වීම ;
(ඈ) කල් ඉකුත් වීමේ දිනය විශේෂිතව දැක්වීම ;
(ඉ) ප්‍රබලතාව විශේෂිතව දැක්වීම ;
(ඊ) නිෂ්පාදකයාගේ සහ/හෝ ආනයනකරුගේ නම සහ ලිපිනය විශේෂිතව දැක්වීම හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද වෙළෙඳ නාමය විශේෂිතව දැක්වීම.

මේ සම්බන්ධව පිළිවෙලින් 2003 අගෝස්තු මස 25 වැනි දින අංක 1303/1 දරන අති විශෙෂ ගැසට් පත්‍රය සහ 2005 අගෝස්තු මස 26 වැනි දින අංක 1407/23 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මගින් පනවන ලද විධාන අංක 2 සහ 4හි සඳහන් "ඇසුරුම් කළ හෝ බහාලුම් ගත ඖෂධ වර්ග සහ විටමින් වර්ග " යන අයිතමය පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් මෙයින් ඉවත් කරනු ලැබේ.

මෙම විධානය වර්ෂ 2013 ජනවාරි මස 01 වැනි දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

රූමි මර්සූක්,
සභාපති.

2012 දෙසැම්බර් මස 04 වැනි දින,
කොළඹ දී ය.

12-511/1